අගතිකාරී සමාජ ආකල්පවලට කොටු නොවී, කාන්තාවන් සහ පුරුෂයන් සාධාරණ ලෙස නිරූපණය කිරීම යහපත් මාධ්‍ය වාර්තාකරණයක ලක්ෂණයකි. කෙසේ නමුත්, ඇතැම් මාධ්‍ය වාර්තාවන් තුළ එය දක්නට නොලැබෙන අතර, මේ, පාඨක අප විසින් ප්‍රශ්න කළ යුතු එවැනි අවස්ථාවන් කිහිපයකි.

මව්බිම (12/20) සහ දිවයින (12/20) පුවත්පත්වල පිළිවෙලින් "කෝටිපතියාගේ නිවෙස ලියාගන්න 19 හැවිරිදි අනියම් පෙම්වතිය ගැසූ ගැටය අතේ පත්තු වෙලා" සහ "කෝටිපති ව්‍යාපාරිකයාගේ නිවස බලෙන් ලියා ගැනීමටතැත් කළ අනියම් පෙම්වතිය දැලේ" යන සිරස්තලයන් යටතේ පළ වූ පුවත් වාර්තා දෙකක අන්තර්ගතය තුළ අදාළ කාන්තාව "සුරූපී" බව දක්වා තිබුණි. මව්බිම (12/19) තුළ පළ වූ "මැරුණයි කියල හිතපු ජර්මන් සුරූපිනිය මීගමුව හෝටලයකින් මතු වුණේ කොහොමද?" සිරස්තලයෙහිද බාහිර රූපය පදනම් කරගනිමින් අදාළ කාන්තාව "සුරූපිනියක්" ලෙස දක්වා තිබුණි. එමෙන්ම, ලංකාදීප (01/05) තුළ ද "අන්තර්ජාල දැලට සුරූපිනියන් එලා විකුණලා" යන සිරස්තලයෙහි ලිංගික ශ්‍රමයේ යෙදවූ කාන්තාවන් පිරිසක් "සුරූපිනියන්" ලෙසින් විස්තර කර තිබුණි.

1) මෙවැනි දැක්වීම් ඔස්සේ කාන්තා බාහිර රූපය ඉස්මතු කිරීම පුවතට අදාළ වන්නේ යැයි ඔබ සිතන්නේ ද?

2) එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ඒකාකෘත කිරීම් (stereotyping) ප්‍රවර්ධනයක් කිරීමක් නොවන්නේද?

3) මෙම කියූ පුවත්, කාන්තා බාහිර රූපය හුවා නොදක්වමින් පවා, පුවතෙහි අන්තර්ගතයට බලපෑමක් නොවන අයුරින් ඉදිරිපත් කිරීමට හැකි නොවන්නේද?